**ඉඩම් මැනුම් සභාව - 2017**

-----------------------------------

ඉඩම් මැනුම් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 57(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් සභාවේ සභාපතිවරයා වෙත 2018 අප්‍රේල් 27 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 හි 25 ඡේදයට පටහැනිව, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී රු.1,000,000 ක ආයෝජන කල් පිරීම්, කාරක ප්‍රාග්ධන වෙනස්වීමේ ගැලපීමක් ලෙස දක්වා තිබුණු අතර, ප්‍රවර්තන වර්ෂයේ පරිගණක මිලදී ගැනීම් වෙනුවෙන් වැය කරන ලද රු.125,370 කින් පෙර වර්ෂයේ වැඩිපුර ගෙවීම් වෙනුවෙන් වූ රු.48,773 ක ආපසු ලැබීම් හිලව් කර ශුද්ධ වටිනාකම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුලත් කර තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සේවක පාරිතෝෂික සම්බන්ධයෙන් සභාව විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණු අතර, සේවක පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදනයන් සිදුකර නොතිබුණි.

**2.2.3** **ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂය තුලදී සිදුකරන ලද විවිධ විෂමාචාර වෙනුවෙන් මිනින්දෝරුවරුන්ගෙන් අයකිරීමට මැනුම් සභාව විසින් තීරණය කරන ලද රු.62,500 ක දඩ මුදල් රු.15,000 ක් ලෙස ගිණුම් ගතකර තිබීම නිසා ආදායම හා ජංගම වත්කම් රු.47,500 කින් අඩුවෙන් සටහන්කර තිබුණි.

**2.3** **නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| 2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනත.<br>(අ) 12(1) වගන්තිය | ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරයකු විසින් සකස්කර සහතික කරන ලද නිශ්චිත වර්ගවල මුල් පිඹුරු හෝ සිතියම් පිටපත් දත්ත පාදකයක් (Data Base) පිහිටුවීම සඳහා තැන්පත් කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 43(1) හා (2) වගන්තිය | සභාව විසින් සියළුම ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ නම් ලැයිස්තුවක් ගැසට් පත්‍රයේ පලකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචි බලපත්‍රලත් මිනින්දෝරුවරුන්ගේ සංඛ්‍යාව 1004 ක් වුවද, 2017 මාර්තු 23 දිනැති අංක 2011/24 දරන ගැසට් පත්‍රයේ මිනින්දෝරුවරුන් 841 දෙනෙකුගේ ගේ නම් පමණක් පල කර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,013,039 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.834,430 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.178,609 ක පිරිහීමක් දක්නට ලැබුණි. වැටුප් හා වේතන රු.186,294 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී 2012 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා උච්ඡාවචනයන් සහිතව මූල්‍ය අතිරික්තයක් පෙන්නුම් කෙරුණි. එසේ වුවද 2015 හා 2016 වර්ෂවලදී එය ඌනතාවයක් බවට පත්වී තිබූ අතර 2017 වර්ෂයේදී එම ඌනතාවය රු.1,013,039 ක් දක්වා වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2012 වර්ෂයේ දී රු.3,325,057 ක් වූ දායකත්වය උච්ඡාවචනයන් සහිතව 2017 වර්ෂයේ දී රු.2,878,815 ක් වී තිබුණි.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ආයතනයේ ජංගම අනුපාතය 2017 හා 2016 වර්ෂවලදී පිළිවෙලින් 0.93 ක් හා 1.19 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ජංගම අනුපාතය පහල මට්ටමක පැවතුණි. මේ සඳහා සමාලෝචිත වර්ෂයේදී කෙටි කාලීන ස්ථාවර තැන්පතු මුදල් කරගෙන වර්ෂයේ වියදම් දැරීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. ජංගම වත්කම් තුළ 2017 වර්ෂයේ දී සියයට 63 ක් හා 2016 වර්ෂයේ දී සියයට 81 ක් නියෝජනය වනුයේ මුදල් හා මුදල්වලට සමාන දෑ වන අතර ඒ අනුව ආයතනය විශාල වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම්වල රඳවා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 4.1 කාර්යසාධනය

-----------------

2002 අංක 17 දරන මැනුම් පනත ප්‍රකාරව, මැනුම් වෘත්තීය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තුවන්නා වූ තාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟවන ලෙස පුහුණුවක් හෝ අධ්‍යාපනයක් වෘත්තියට ප්‍රවේශවන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වා ගනු ලබන බවටත් තහවුරු කිරීම සභාවේ අරමුණු වේ.

සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳව මහජනතාවගෙන් ලැබී විසඳීමට තිබූ මුළු පැමිණිලි සංඛ්‍යාව 125 ක් වුවද වර්ෂය තුල විසදා තිබුණේ පැමිණිලි 96 ක් හෙවත් සියයට 77 ක ප්‍රමාණයක් පමණි.

(ආ) සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී වෘත්තීය සංවර්ධන වැඩසටහන් 06 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණ ද පවත්වා තිබුණේ වැඩසටහන් 03 ක් පමණි.

(ඇ) ස්වකීය නිළධාරීන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීමට සහ සුභසාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීමට සැලසුම් කර තිබුණද ඒවා ක්‍රියාත්මක කර නොතිබුණු අතර, සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් අවශ්‍ය රීති සකස්කර ද නොතිබුණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ කටයුතු ආරම්භ කළ 2005 වර්ෂයෙන් පසුව මිනින්දෝරුවරයකු සභාවේ ලියාපදිංචි වීමේදී අයකරනු ලබන රු.3,500 ක් වූ ලියාපදිංචි ගාස්තුව හා 2010 වර්ෂයෙන් පසුව වාර්ෂික බලපත්‍ර වෙනුවෙන් මිනින්දෝරුවරයකුගෙන් අයකරනු ලබන රු.2,500 ක් වූ ගාස්තු සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා සංශෝධනය කර නොතිබුණි.

(ආ) වාර්ෂික බලපත්‍ර නිකුත් කරනු ලැබීමට හිමිකම් ඇති සෑම මිනින්දෝරුවරයකුම ඉඩම් මැනුම් පනත යටතේ ලියාපදිංචි විය යුතු බව දක්වා ඇතත්, වාර්ෂිකව බලපත්‍ර ලබා නොගෙන වෘත්තීය මිනින්දෝරු කටයුතුවල යෙදෙන පුද්ගලයින් හඳුනාගැනීමට හෝ එවන් කටයුතු තහනම් කිරීමට සභාව විසින් නීති රීති හඳුන්වා දී නොතිබුණි.

**4.3 ආර්ථික නොවූ ගනුදෙනු**

---------------------------

වටිනාකම රු.500,000 ක් වූ ස්ථාවර තැන්පතු දෙකක් කල් පිරෙන දිනයට පෙර මුදල් කර ගැනීම නිසා සභාවට රු.14,375 ක පොලී ආදායමක් අහිමි වී තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

2002 අංක 17 දරන ඉඩම් මැනුම් පනතේ 38(ඇ) ඡේදය පරිදි සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා ප්‍රමාණවත් නිළධාරීන් හා සේවකයින් පත්කළ යුතු බව සඳහන් කර තිබුණ ද, 2018 මාර්තු 31 දින වන විටත් සභාවට බඳවාගෙන තිබුණේ ලිපිකරුවන් දෙදෙනෙකු සහ කාර්යාල කාර්ය සහායකවරයකු පමණි. ඒ අනුව නිළධාරීන්ගේ හිඟය, පැමිණිලි විසඳීමේ හා ලිපිගොනු යාවත්කාලීන කිරීමේ කටයුතුවලට බාධාවක් වී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------------

**5.1 අයවැය ලේඛනමය පාලනය**

----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අයවැයගත ආදායම් වියදම් තථ්‍ය ආදායම් වියදම් සමඟ සැසඳීමේ දී ආදායම් ශීර්ෂ 03 ක හා වැය විෂයයන් 07 ක සියයට 24 සිට සියයට 386 ක් දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) නිළධාරීන් පුහුණු කිරීම සඳහා අයවැය ලේඛනය මගින් රු.100,000 ක ප්‍රතිපාදන සලසා තිබුණද, පුහුණු වැඩමුළු පවත්වා නොතිබුණි.

(ඇ) මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙහි රු.380,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද ඉන් රු.254,630 ක් හෙවත්, සියයට 67 ක් වර්ෂ අවසානයට ඉතිරිකර තිබුණි.

## 5.2 නොවිසඳී ඇති විගණන ඡේද

2009 වර්ෂයේ ජනවාරි මාසයේ සිට සභාවේ ලේකම් තනතුර පුරප්පාඩුව පවතින අතර එම තනතුරට නිළධාරයකු බඳවා ගැනීමට කටයුතු කරන ලෙසට 2012 ජුලි 05 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නියෝග කර තිබුණි. එම බඳවා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.99,288 ක් වැයකර තිබුණද විගණන දිනය වූ 2018 මාර්තු 31 දක්වාම එම තනතුර පිරවීමට නොහැකිව තිබුණි.

## 5.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2015 සහ 2016 වර්ෂ වලට අදාල සභාවේ වාර්ෂික වාර්තා 2018 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 5.4 සමාජ වගකීම් ඉටුකිරීම

බලයලත් මිනින්දෝරුවරුන් විසින් මැනුම්කර සකස් කරන පිඹුරු, මහජනතාවට ලබාගැනීමට හැකිවන පරිදි ඒවායේ පිටපත් මිනින්දෝරුවන් වෙතින් ලබාගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | ඇතැම් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය නොකිරීම නිසා ගිණුම්කරණ අඩුපාඩු පැවතීම. |
| (ආ) ආදායම් පාලනය | ගාස්තු සංශෝධනය කර නොතිබීම. |